කොරෝනා අඩු රටවල්වලින්
විදේශ නිරීක්ෂකයන්

# 20ක් ගෙන්වීමේ අවධානය

14/06/2020

චමින්ද සේනාරත්න

එළඹෙන මහ මැතිවරණය නිරීක්ෂණය කිරීම සඳහා නිරෝධායන නීතිවලට සම්බන්ධ විදේශ නිරීක්ෂකයන් මාසයකට පෙර ගෙන්වා ගැනීමට අනුමැතිය ලබාදෙන ලෙස ෆැපරල් සංවිධානය මැතවරණ කොමිෂමෙන් ඉල්ලීමක් කළ බව එහි විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි පැවසිය.

ඒ අනුව ආසියානු මැතිවරණ නිරීක්ෂණ ජාලයේ සාමාජික රටවල් 15-25ත් අතර පිරිසක් ගෙන්වීමට සැලසුම් කර ඇත.

එසේ පැමිණෙන සාමාජිකයන් දැනට ආසියාවේ වැඩි වශයෙන් කොරෝනා ව්‍යසනය ඇති ඉන්දියාව, බංග්ලාදේශය, පාකිස්තානය වැනි රටවලින් බැහැරව කැඳවීමට තීරණය කර තිබේ. එසේ පැමිණෙන සාමාජිකයන් රට තුළට ඇතුළුවීමෙන් පසු දින 14ක් නිරෝධායනයට ලක් කිරීමටද තීරණය කර ඇත.

දේශපාලන පක්ෂ සමග සාකච්ඡා කර ඒ සඳහා තීන්දුවක් ගන්නා බව මැතිවරණ කොමිසම පැවසූ බව හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය. විදේශ නිරීක්ෂකයන් කැඳවීමට හැකිවුවහොත් එය කොරෝනා පවතින තත්ත්වයක් තුළ ඡන්දයක් විදේශ නිරීක්ෂණය සමගින් පැවති රටක් වශයෙන් ලබන ජයග්‍රහණයක් බවද සඳහන් කළේය.